ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය Business & Accounting Studies

| 60 | S | I, II |
|---|---|---|

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) තරග විභාගය 2022 පෙබරවාරි
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2022 செப்டம்பர்
Genaral Certificate of Education (Ord. Level) Examination, February 2022

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය I, II
வணிகக் கல்வியும் கணக்கீடும் I, II
**Business and Accounting Studies I, II**

පැය තුනයි
*Three hours*

10 ශ්‍රේණිය
*Grade 10*

## ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය I

සැලකිය යුතුය :
(i) සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
(ii) 1 සිට 40 තෙක් ප්‍රශ්න වල දී ඇති (1), (2), (3), (4) පිළිතුරු වලින් නිවරැදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරා ගන්න.
(iii) ඔබට සැපයෙන උත්තර පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය මත (x) ලකුණ යොදන්න.

අත්කම් නිර්මාණය කිරීම පිළිබඳ පුහුණුවක් ලබා ඇති ශාලිකා වේවැල්, කෙසෙල් පට්ටා වැනි ස්වභාවික අමුද්‍රව්‍ය යොදා ගෙන විවිධ හැඩයේ කලාත්මක අත්බෑග් නිෂ්පාදනය කර, තම නිවස ආසන්නයේ ඇති නගරයේ ඇති වෙළෙඳ සැල් කිහිපයකට ඉදිරිපත් කළාය. ඉතා කෙටිකාලයකින් තම නිෂ්පාදන සඳහා හොඳ ඉල්ලුමක් පැවති අතර එම ඉල්ලුම තනිවම සපුරා ලීමට නොහැකි වීම නිසා පුහුණු සේවිකාවන් දෙදෙනෙකු තම ව්‍යාපාරයට බඳවා ගන්නා ලදි.

ඉහත ඡේදය කියවා 1 සිට 3 දක්වා ප්‍රශ්ණා වලට පිළිතුරු සපයන්න.

01. ශාලිකා ව්‍යාපාරය අයත් වන ව්‍යාපාරය,
01. වෙළෙඳ ව්‍යාපාරයකි. 02. සේවා සපයන ව්‍යාපාරයකි.
03. සුළු පරිමාණ ව්‍යාපාරයකි. 04. නිෂ්පාදන ව්‍යාපාරයකි

02. මෙම ව්‍යාපාරයේ දැකිය හැකි ශක්තියක් වන්නේ,
01. අපතේ යන ද්‍රව්‍ය භාවිතය 02. අවශ්‍ය ප්‍රමාණය සැපයිය නොහැකි වීම
03. අත්කම් නිර්මාණ පිළිබඳ පුහුණුවක් ලබා තිබීම 04. නිවස නගරය ආසන්නයේ පිහිටා තිබීම.

03. ශාලිකාගේ ව්‍යාපාරයේ ඇති ලක්ෂණයක් නොවන්නේ,
01. ලියාපදිංචිය අනිවාර්ය නොවීම. 02. බලපාන නීතිරීති අඩුවීම
03. අලාභය තනිවම භුක්ති විඳීම. 04. අඛණ්ඩ පැවැත්මක් තිබීම.

04. පොදු අංශයට අයත් ව්‍යාපාර සංවිධාන කාණ්ඩය වන්නේ,
01. සමුපකාර, රාජ්‍ය සංස්ථා, දෙපාර්තමේන්තු 02. රාජ්‍ය සමාගම්, සංස්ථා, දෙපාර්තමේන්තු
03. රාජ්‍ය සංස්ථා, දෙපාර්තමේන්තු, සමිති සංවිධාන 04. රාජ්‍ය සමාගම්, සමුපකාර, දෙපාර්තමේන්තු

05. නීතිමය පුද්ගලභාවයක් නොමැති ව්‍යාපාර වර්ග වන්නේ,
01. රාජ්‍ය සමාගම් හා සංස්ථා 02. තනි පුද්ගල හා හවුල් ව්‍යාපාර
03. දෙපාර්තමේන්තු හා සමාගම් 04. සංස්ථා හා සමුපකාර

06. පහත ව්‍යාපාර වලින් සේවා සැපයීමේ ව්‍යාපාරයක් නොවේ.
01. ආහාර ද්‍රව්‍ය සකස් කිරීමේ ව්‍යාපාර 02. බැංකු ආයතන
03. රූපලාවන්‍ය ආයතන 04. උසස් අධ්‍යාපන ආයතන

07. ඒක පුද්ගල ව්‍යාපාරයක් ආරම්භ කර ව්‍යාපාර නාමය ලියාපදිංචිය සඳහා අයදුම්පත්‍ර ඉදිරිපත් කළ යුත්තේ දින කීයක් ඇතුළත ද?
01. දින 07 02. දින 20 03. දින 14 04. දින 21

08. හිමිකාරිත්වය අනුව ව්‍යාපාර සංවිධාන වර්ග කරන්නේ,
01. සුළු පරිමාණ හා මහා පරිමාණ ව්‍යාපාර 02. ලාභ අරමුණු හා ලාභ අරමුණු නොවු ව්‍යාපාර
03. පෞද්ගලික හා ලාභ අරමුණු වු ව්‍යාපාර 04. පෞද්ගලික හා පොදු අංශයේ ව්‍යාපාර

09. පහත ප්‍රකාශ අතරින් නිවැරදි ප්‍රකාශය තෝරන්න.
01. රැකියා අවස්ථා උත්පාදනය කළමණාකරුවන්ගේ ව්‍යාපාරික අරමුණක් වේ.
02. පුද්ගලයන් කිහිප දෙනෙකු එක් ව්‍යාපාරයක අයිතිකරුවන් විය නොහැක.
03. පාරිභෝගිකයන්ගේ රුචිකත්වය පිළිබඳව සලකා බලා නිෂ්පාදකයන් නිෂ්පාදන, වෙළෙඳ පොළට ඉදිරිපත් කරයි
04. ව්‍යාපාර ඇල්මැති පාර්ශවයන්ගෙන් කිසිදු දායකත්වයක් බලාපොරොත්තු නොවේ.

10. පූර්ණ වශයෙන් ම රජය සතු ව්‍යාපාර සංවිධානය වන්නේ,
01. සමූපකාරය 02. සංස්ථා 03. දෙපාර්තමේන්තු 04. සංස්ථාපිත සමාගම්

11. රාජ්‍ය සංස්ථාවක දැකිය හැකි ලක්ෂණ වන්නේ,
01. අඛණ්ඩ පැවැත්මක් තිබීම, අරමුදල් රජය සැපයීම, පූර්ණ අයිතිය රජය සතුවීම
02. නෛතික පුද්ගලභාවයක් පැවතීම, අයිතිය හා පාලනය රජය සතු වීම, පොදු හෝ විශේෂ පනතකින් ආරම්භ කළ හැකි වීම.
03. විශේෂ පනතකින් ආරම්භ කළ හැකි වීම, අඛණ්ඩ පැවැත්ම, ප්‍රජාතන්ත්‍රවාදි පාලනය
04. අරමුදල් රජය සැපයීම, විවෘත සාමාජිකත්වය, අඛණ්ඩ පැවැත්ම.

12. සාමාජ සුභ සාධනය අරමුණු කරගත් ව්‍යාපාර සංවිධාන,
01. සමුපකාර, සංමිති සංවිධාන 02. සමිති සංවිධාන, රාජ්‍ය සමාගම්
03. තනි පුද්ගල හා හවුල් ව්‍යාපාර 04. සමූපකාර, සංස්ථාපිත සමාගම්

13. පහත දැක්වෙන පරිසර සාධක අතුරෙන් අභ්‍යන්තර පරිසර සාධකයක් වන්නේ,
01. ගනුදෙනුකරුවන් 02. කළමණාකරුන් 03. තරගකරුවන් 04. සැපයුම්කරුවන්

14. පෞද්ගලික අංශය සතු ලාභ අරමුණු නොවූ ව්‍යාපාර සංවිධාන,
01. හවුල් ව්‍යාපාර හා සමිති සංවිධාන 02. තනි පුද්ගල ව්‍යාපාර හා සමූපකාර
03. සමූපකාර හා හවුල් ව්‍යාපාර 04. සමිති සංවිධාන හා සමූපකාර

15. ආර්ථික පරිසරයට අයත් සාධකයකි.
01. අණපනත් 02. නීතිරීති 03. ඉතුරුම් 04. තාක්ෂණය

16. විදේශ විනිමය අනුපාතය ඉහළ අගයක් ගැනීම නිසා,
01. ආනයන ප්‍රමාණය සීමා වේ. 02. රටක ඉතුරුම් සහන අගයක් ගනී
03. අපනයන ආදායම වැඩි වේ. 04. ආයෝජනය ඉහල අගයක් ගනී.

17. ජංගම දුරකථන භාවිතයෙන් ගෙවීමේ ක්‍රමය ලංකාවට හඳුන්වා දුන් වර්ෂය,
01. 2012 02. 2013 03. 2014 04. 2015

18. තාක්ෂණය භාවිතයෙන් ව්‍යාපාරයක සිදුවෙන ව්‍යාපාරික කටයුත්තක් වන්නේ,
01. කාසි හා නෝට්ටු වෙනුවට ණයපත් භාවිතය
02. බැංකු ගිණුම් පොත් පවත්වාගෙන යාම.
03. විකුණුම් කටයුතු සඳහා ඉලෙක්ට්‍රොනික උපකරණ භාවිත නොවීම
04. ගනුදෙනු මූලික පොත්වල හා ලෙජරයේ සටහන් කිරීම.

19. ටෙලි බැංකු සේවා ක්‍රමයෙන් ව්‍යාපාරිකයෙකුට ඉටුකර ගත හැකි කාර්යයක් වන්නේ,
01. මූල්‍යමය ගනුදෙනු ඉතා ඉක්මනින් සපුරාගත හැකි වීම.
02. ගනුදෙනු කිරීම පහසු වීම.
03. බැංකුවට නොගොස් මුදල් පාලනය කළ හැකි වීම.
04. ජල විදුලි බිල්පත් ආදිය ගෙවීමට හැකි වීම.

20. රු. 2,000ක භාණ්ඩ රු. 2,500කට ණයට විකිණීම ගිණුම්කරණ සමීකරණයට බලපෑමේ අවසාන ප්‍රතිඵලය නම්,

01. වත්කම් වැඩි වේ, හිමිකම් වැඩි වේ.
02. වත්කම් වැඩි වේ, හිමිකම් අඩු වේ.
03. වත්කම් අඩු වේ, හිමිකම් අඩු වේ.
04. වත්කම් අඩු වේ, හිමිකම් වැඩි වේ.

21. රු. 50,000ක බැංකු ණය ලබා ගැනීමට අදාල ද්විත්ව සටහන වන්නේ,

01. බැංකු ගිණුම හර, මුදල් ගිණුම බැර
02. ණය ගිණුම හර, බැංකු ගිණුම බැර
03. මුදල් ගිණුම හර, බැංකු ණය ගිණුම බැර
04. බැංකු ගිණුම හර, බැංකු ණය ගිණ්ම බැර

22. ජංගම නොවන වත්කම් අයත් කාණ්ඩය තෝරන්න.

01. ඉඩම්, මෝටර් රථ, ලී බඩු, බඩු තොගය
02. උපකරණ, යන්ත්‍ර, බඩුතොග, ඉඩම්
03. බඩුතොගය, මෝටර් රථ, මුදල්, යන්ත්‍ර
04. උපකරණ, යන්ත්‍ර, ඉඩම්, මෝටර් රථ

23. බැංකු සැසඳුම් විස්තරය සෑදීම සඳහා අදාළ ගනුදෙනුව,

01. බැංකුව අය කළ ගාස්තු
02. සෘජු ප්‍රේෂණ
03. නිකුත්කළ උපලබ්ධි නොවූ චෙක්
04. නිත්‍ය නියෝග මත ගෙවීම්

24. ද්විත්ව සටහන වැරදි ලෙස සටහන් වී ඇත්තේ,

01. මුදල් ගිණුම හර, ප්‍රාග්ධන ගිණුම බැර
02. ලැබූ පොලී ගිණුම හර, මුදල් ගිණුම බැර
03. ගමන් වියදම් ගිණුම හර, මුදල් ගිණුම බැර
04. මුදල් ගිණුම හර, විකුණුම් ගිණුම බැර

25. ණයගැතියන්ගෙන් සෘජුවම බැංකු ගිණුමට මුදල් ලැබීම නිසා,

01. බැංකු ශේෂය වැඩි වේ.
02. බැංකු ශේෂය අඩු වේ.
03. මුදල් ශේෂය වැඩි වේ.
04. මුදල් ශේෂය අඩු වේ.

26. බැංකු සැසඳුම පිළියෙළ කිරීම සඳහා උපයෝගී කර ගන්නා මූලාශ්‍ර ලේඛණයකි.

01. පිළිපත 02. බැංකු ප්‍රකාශය 03. තැන්පතු පත්‍රිකාව 04. ලදුපත

27. විකුණුම් ජ'නලයේ එකතුව ලෙජරයට පිටපත් කරන්නේ,

01. මුදල් ගිණුම හර, විකුණුම් ගිණුම බැර
02. ණයහිමි ගිණුම හර, විකුණුම් ගිණුම බැර
03. විකුණුම් ගිණුම හර, ණයගැති ගිණුම බැර
04. ණයගැති ගිණුම හර, විකුණුම් ගිණුම බැර

28. පොදු ජ'නලයේ සටහන් කරන ගනුදෙනුවක් වන්නේ,

01. රු. 3,000 ක භාණ්ඩ ණයට ගැනීම
02. රු. 1,000 ක භාණ්ඩ ණයට විකිණීම.
03. රු. 4,000ක ලී බඩු කුරේ සමාගමෙන් ගැනීම
04. රු. 4,000ක් ණයහිමියන්ට ගෙවීම.

29. නොගැලපෙන පිළිතුර තෝරන්න.

01. වියදම් වැඩිවීම හර 02. ආදායම් වැඩිවීම හර 03. වියදම් අඩුවීම බැර 04. වගකීම් වැඩිවීම බැර

30. ගැනිලි සටහන් කිරීමට අදාල ද්විත්ව සටහන වන්නේ,

01. ගැණුම් ගිණුම හර, ගැනිලි ගිණුම බැර
02. ගැණුම් ගිණුම හර, මුදල් ගිණිම බැර
03. ගැනිලි ගිණුම හර, මුදල් ගිණුම බැර
04. මුදල් ගිණුම හර, ගැනිලි ගිණුම බැර

31. ණයහිමියකු වූ සාරංගට රු. 10,000 මුදලක් ගෙවීමේ දී ගෙවිය යුතු මුදලෙන් 2% ක් අඩු කරන ලදි. මෙම අඩු කිරීම සටහන් කරන්නේ,

01. ලද වට්ටම් ගිණුමේ ය.
02. දුන් වට්ටම් ගිණුමේ ය
03. මුදල් වට්ටම් ගිණුමේ ය.
04. වෙළෙඳ වට්ටම් ගිණුමේ ය.

32. බැංකු ගිණුමේ ශේෂයට වඩා බැංකු ප්‍රකාශයේ ශේෂය වැඩිවීමට හේතුවක් වන්නේ,

01. බැංකු ගාස්තු අය කර ගැනීම
02. තැන්පත් කළ චෙක්පත් නිශ්කාෂණය නොවීම
03. නිකුත් කළ චෙක්පත් වලට ගෙවීම
04. ණයගැති ප්‍රේෂණ වලට එකතු කිරීම.

33. බැංකු අයිරාවක් යනු,

01. ජංගම ගිණුමේ මුදල් නොමැති ඕනෑම අවස්ථාවක ජංගම ගිණුම් හිමියාට චෙක්පත් නිකුත් කිරීමට බලයකි.
02. ජංගම ගිණුමේ මුදල් තැන්පත් කිරීමට හැකි අවස්ථාව යි.
03. ගිණුමේ මුදල් ප්‍රමාණවත් නොවන අවස්ථාවක එම මුදලට වඩා යම් නිශ්චිත වටිනාකමක ට චෙක්පත් නිකුත් කිරීමට බැංකුව දී ඇති අවසරයයි.
04. බැංකු ගිණුම ඇපයට තබා ණය ගත හැකි ප්‍රමාණයයි.

34. පහත A තීරුවේ ගිණුම් වර්ගය ද B තීරුවේ ගිණුම් වර්ග වලට නිදසුන් ද දක්වා ඇත. ගිණුම් වර්ග වලට නිදසුන් නිවැරදිව පිළිවෙලින් ගැලපු විට පිළිතුර,

| A | B |
|---|---|
| හිමිකම් ගිණුම | A සංග්‍රහ වියදම් ගිණුම |
| වියදම් ගිණුම | B ආයෝජන ආදායම් ගිණුම |
| ආදායම් ගිණුම | C ගැනිලි ගිණුම |
| වගකීම් ගිණුම | D ගෙවිය යුතු විදුලි බිල් ගිණුම |

1. A CADB
02. CABD
03. ACDB
04. BDAC

35. තැන්පත් කළ චෙක්පත් අගරු වීම සටහන් කරන්නේ,

01. මුදල් ගිණුම හර, බැංකු ගිණුම බැර
02. ණයගැති ගිණුම හර, බැංකු ගිණුම බැර
03. බැංකු ගිණුම හර, ණයගැති ගිණුම බැර
04. ණයහිමි ගිණුම හර, මුදල් ගිණුම බැර

36. ගිණුම්කරණයට අදාල නොවන ගනුදෙනුව තෝරන්න.

01. සේවක වැටුප් ගෙවීම
02. බැංකු ණය ලබා ගැනීම
03. කළමණාකරුවෙකු බඳවා ගැනීම
04. ලී බඩු මිලදී ගැනීම

37. රු. 1,000,000ක් වටිනා මෝටර් රථයක් BMW ආයතනයෙන් ණයට ලබා ගැනීම ව්‍යාපාරයේ සටහන් කරන මුලික පොත හා ඊට අදාල මුලාශ්‍ර ලේඛනය තෝරන්න.

01. පොදු ජ්නලය හා ජ්නල් වවුචරය
02. ගැණුම් ජ්නලය හා ගැණුම් ඉන්වොයිසිය
03. පොදු ජ්නලය හා ඉන්වොයිසිය
04. ගැණුම් ජ්නලය හා ජ්නල් වවුචරය.

38. ව්‍යාපාරයක සුළු මුදල් අග්‍රිමයේ වටිනාකම රු 2,500කි. 2022 ජනවාරි මාසය සඳහා දරණ ලද සුළු මුදල් වියදම් වල වටිනාකම රු. 2,450ක් නම් පෙබරවාරි මාසය සඳහා ප්‍රතිපූරණය කළ යුතු මුදල,

01. රු. 2,500
02. රු. 2,450
03. රු. 50
04. රු. 4,950

39. රක්ෂණ ගාස්තු ලෙස ගෙවන ලද රු. 750 මුදල් පොතේ මෙන්ම රක්ෂණ ගාස්තු ගිණුමේ ද බැරට සටහන් කර ඇත. මෙම වරද නිවැරදි කිරීමේ ද්විත්ව සටහන වන්නේ,

01. රක්ෂණ ගාස්තු ගිණුම හර රු. 750, අවිනිශ්චිත ගිණුම බැර රු. 750
02. අවිනිශ්චිත ගිණුම හර රු. 1,500, රක්ෂණ ගිණුම බැර රු. 1,500
03. රක්ෂණ ගාස්තු ගිණුම හරු රු. 1,500, අවිනිශ්චිත ගිණුම බැර රු. 1,500
04. රක්ෂණ ගාස්තු ගිණුම හර රු. 750, මුදල් පොත බැර රු. 750

40. විකුණුම් ගිණුම හා බැංකු ණය ගිණුම අයත් ගිණුම් කාණ්ඩය පිළිවෙලින්,

01. වත්කම් හා වගකීම්
02. වත්කම් හා ආදායම්
03. ආදායම් හා හිමිකම්
04. ආදායම් හා වගකීම්

සා.පෙළ ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයන දේශක
සිසිර කුමාර
විසින් සම්පාදිත යි.